දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය
எனது இல.
My No.
PSC/EST/09-08/01/2020

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2023.12. 21

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 05/2023

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන බලතල සම්බන්ධයෙන් පරිපාලනමය කාර්යයන් භාර බලධරයින් නම් කිරීම.</u>

අංක 2310/29 දරන හා 2022.12.14 දිනැති රජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළවූ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XXII පරිච්ඡේදයේ XIV වැනි වගන්තිය ප්‍රකාරව පහත වගුවේ (අ) තීරුවේ දක්වා ඇති සේවා සහ තනතුරු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන බලතලවලට අදාළව පරිපාලන කාර්යයන් භාරව කටයුතු කිරීම සඳහා එහි (ආ) තීරුවේ දැක්වෙන නිලධාරීන් නම් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

| | සේවාවන් / නිලධාරීන් (අ) | පරිපාලන කාර්යයන් පවරනු ලබන බලධාරීන් (ආ) |
|---|---|---|
| I. | i. ශ්‍රී ලංකා පරිපාලන සේවය<br>ii. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය<br>iii. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය<br>iv. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය<br>v. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය<br>vi. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් |
| II. | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් |
| III. | ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | පශු සම්පත් සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් |
| IV. | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | මිනින්දෝරු විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් |
| V. | දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන, අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම (II)හි අර්ථනිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් සහ තෘතියික මට්ටමේ අධි ශ්‍රේණියේ / විශේෂ ශ්‍රේණියේ නිලධරයන්, | තනතුර අයත් වන අමාත්‍යාංශය හෝ තනතුර අයත් වන දෙපාර්තමේන්තුව භාර අමාත්‍යාංශයේ ලේකම් |

| | | |
|---|---|---|
| VI. | දිප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන සහ අමාත්‍යාංශයක් යටතේ නොවන, අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම (II)හි අර්ථනිරූපනය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් සහ තෘතියික මට්ටමේ අධි ශ්‍රේණියේ / විශේෂ ශ්‍රේණියේ නිලධරයන්, | අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා |
| VII. | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධිශ්‍රේණියේ නිලධාරින්<br><br>ඒකාබද්ධ සේවයේ අධිශ්‍රේණියේ නිලධාරින් | රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් |

02. ඉහත (ආ) තීරුවේ දැක්වෙන අමාත්‍යාංශ ලේකම්වරයකුගේ පරිපාලන බලධාරීත්වය යටතට ගැනෙන (අ) තීරුවේ සඳහන් කුමන හෝ සේවාවක් තනතුරකට අදාළ කරුණක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අවශ්‍ය වන නිර්දේශයක්, නිරීක්ෂණයක් හෝ වෙනත් තොරතුරක් තමන් වෙනුවෙන් එම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා තම අමාත්‍යාංශයේ වෙනත් නිලධරයකු නම් කිරීමට එම සෑම ලේකම්වරයකුට හැකියාව ඇති අතර ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

03. ඉහත 02 හි සඳහන් පරිදි අමාත්‍යාංශ ලේකම්වරයකු විසින් නම් කරනු ලැබ ඇති නිලධරයකු තම ලේකම්වරයා වෙනුවට නිර්දේශ, නිරීක්ෂණ හෝ වෙනත් තොරතුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමේදී පහත පාඨය තම ලිපියේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

" ...... අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නියමය පරිදි ලේකම්වරයා වෙනුවෙන් ඉදිරිපත් කරමි."

04. මෙම චක්‍රලේඛය 2023.12.20 දින සිට ක්‍රියාත්මක වීමත් සමඟම මෙම කරුණ සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති 2011.12.13 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 05/2011, කොමිෂන් සභාව විසින් හෝ වෙනත් නිසි බලධරයකු විසින් හෝ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව සිදුකර ඇති කිසිදු දෙයකට අගතියක් නොවන පරිදි, අවලංගු වනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

Ndayon

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව